

# Breast Cancer
# (පියයුරු පිළිකා)



**වෛද්‍ය හර්ෂ අලුත්ගේ**
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

සුව සටහන්

ඕස්ට්‍රේලියාවේ සුලභම පිළිකා වර්ග අතුරින් එකක් වන පියයුරු පිළිකාව පිළිබඳව අද අපි කතා කරමු. සෑම ඕස්ට්‍රේලියානු කාන්තාවන් අට දෙනෙකුගෙන් එක් අයෙකුට පියයුරු පිළිකාව වැළෙඳෙන බව හඳුනාගෙන ඇත. එබැවින් සෑම කාන්තාවක්ම තමාගේ පියයුරු වල පිළිබඳව අවධානයෙන් සිටීම වැදගත්ය.

පියයුරු පිළිකා ඕනෑම වයසකදී ඇතිවිය හැකි වුවද වයස 60 ට වඩා වැඩි කාන්තාවන්ට වැළඳීමේ ප්‍රවනතාවය වැඩිය. නමුත් පියයුරු පිළිකාවලින් 25%ක් පමණ වැළඳෙන්නේ වයස අවුරුදු 50ට වඩා අඩු කාන්තාවන්ටයි.

සමහරවිට ඔබ පුදුම විය හැකි නමුත් පිරිමින් හටද ඉතා කලාකුරකින් පියයුරු පිළිකා වැළඳේ. සෑම වසරකම වික්ටෝරියානු ප්‍රාන්තයේ පිරිමින් 25 දෙනෙක් පමණ පියයුරු පිළිකා වැළඳී ඇතිබව හඳුනා ගැනේ. පිරිමින්ට කෙරෙන ප්‍රතිකාරද බොහෝ දුරට කාන්තාවන්ගේ ප්‍රතිකාර වලට සමානවේ.

## පියයුරු පිළිකා සඳහා අවදානම් සාධක කවරේද?

පියයුරු පිළිකා ඇති වීමට නිශ්චිතවම හේතුවක් හඳුනාගෙන නැති නමුදු පහත සඳහන් සාදක එය වැළඳීමේ ප්‍රවනතාව වැඩි කරන බව හඳුනා ගෙන ඇත.

**ප්‍රධාන අවදානම් සාදක** (Major Risk Factors)

01. කාන්තාවන් හට රෝගය වැළඳීමේ ඉඩකඩ වැඩිය.
02. වයස අවුරුදු 50 ට වඩා වැඩිවීම
03. පවුලේ අයකුට පියයුරු පිළිකා වැළඳී තිබීම (තම මවට, සහෝදරියකට හෝ දියණියකට)
04. පෙර කාලයකදී පියයුරු පිළිකාවක් වැළඳී තිබීම
05. පියයුරු වල ඇතිවන සමහර රෝග තත්ව

**වෙනත් අවදානම් සාදක** Additional Risk Factors

01. දරුවන් නොමැති ස්ත්‍රීන් හෝ වයස අවුරුදු 30ට පසුව දරු ප්‍රසූතිය සිදුකල කාන්තාවක් වීම
02. පළමු ඔසප් අඩු වයසකදී සිදුවීම
03. ආර්ථවය (ඔසප් චක්‍රය නතර වීම හෙවත් Menopause) ප්‍රමාදය සිදුවීම
04. අධික මත්පැන් පානය
05. තරබාරු බව
06. උපත් පාලන පෙති භාවිතය
07. හෝමෝන භාවිතය (යසෘඹ)

ඉහත සඳහන් අවදානම් සාදක එකක් හෝ කිහිපයක් තිබූ පමණින් නිශ්චිතවම පියයුරු පිළිකා වැළඳේ යැයි අදහස් නොකෙරේ. ඉන් අදහස් කෙරෙන්නේ එම අවදානම් සාදක පවතින උදවියට රෝගය වැළඳීමේ වැඩි ඉඩකඩක් පවතී යන්න පමණි.

පිරිමින්ගේ ප්‍රධාන අවදානම් සාධක වන්නේ පියයුරු විශාල වීම (Gynaecomastia) නැමැති තත්වයයි.

මෙය බොහෝවිට සමහර ඖෂධ වර්ග, රසායන ද්‍රව්‍ය හෝ හෝමෝන් වර්ග භාවිතා කිරීමේ අතුරු ආබාධයක් ලෙස ඇතිවන තත්වයකි.

එසේම පිරිමින් හට වැළඳෙන සමහර ආවේනික ජාන හා සම්බන්ධ රෝග (උදා: Winfelter Syndrome) ඇති උදවිට හා පවුලේ අයෙකුට පියයුරු පිළිකා වැළඳීමේ ඇතිනම් රෝගයට ගොදුරුවීමේ වැඩි ඉඩකඩක් පවතී.

## පියයුරු ස්වයං පරීක්ෂාව Self Examination of Breast

කාන්තාවන්ගේ ජීවිත කාලය තුල පියයුරුවල යම් යම් වෙනස්කම් සිදුවේ. මෙම වෙනස්කම් විවිධ කරුණු පාදක කරගෙන සිදුවේ.

උදාහරණ වශයෙන් ඔසප් චක්‍රය පටන් ගැනීම හා නතරවීම ගර්භණී භාවය, මව්කිරි දීම, බර අඩු වැඩිවීම, වයස් ගත වීම ආදිය.

එම නිසා කාන්තාවන් තමන්ගේ පියයුරු නිතිපතා ස්වයං පරීක්ෂාවට ලක්කර එහි පෙනුමේ හෝ ස්පර්ශ කරන විට දැනෙන වෙනස්කම් පිළිබඳව අවබෝධයකින් සිටීම වැදගත් වේ.

එවැනි සමහර වෙනස්කම් නම්,

- පියයුරු වල පටක ඝනවීම
- ගැටිති (lumps)
- පියයුරු තුඩු ඇතුලට නෙරීම
- සම මතුපිට රළු බව හෝ ගැටිති ස්වභාවය
- පියයුරු වල පෙනුම වෙනස්වීම හෝ වෙනත් සැකසහිත ඕනෑම වෙනස්කමක්

ඉහත කී ලක්ෂණවලින් 90% ක් පමණ පිළිකා නොවන වෙනත් හේතු නිසාද සිදුවිය හැකි නමුත් ඔබ එවැනි ලක්ෂණයක් නිරීක්ෂණය කළහොත් වෛද්‍යවරයෙකු ලමා පරීක්ෂා කරවා ගැනීම වැදගත්ය.

## පියයුරු පිළිකා කල්තබා හඳුනා ගැනීමේ පරීක්ෂාව (Screening Test)

වයස අවුරුදු 50 - 74 දක්වා කාන්තාවක් හට වසර 2කට වරක් නොමිලයේ මෙම පරීක්ෂාව සිදුකර ගැනීමට හැකිය. වැඩි අවධානමක් ඇති අයට අවුරුදු 40 සිට වුවද මෙය කර ගත හැක.

පියයුරු පිළිකා නිර්ණය කරන්නේ කෙසේද ? (ඎස-"ටබ්දිසි)

ඉහත කී රෝග ලක්ෂණ නිරීක්ෂණය කලහොත් ඔබගේ පවුලේ වෛද්‍යවරයා විසින් විවිධ පරීක්ෂාවන්ට යොමු කරනු ඇත. එම පරීක්ෂා මගින් පියයුරු පිළිකාව වැළඳී ඇතිබව තහවුරු වුවහොත් හෝ සැක සහිත යමක් නිරීක්ෂණය කලහොත් විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත යොමු කරනු ලැබේ.

- Diagnostic Mamogram - X - ray වැනි කිරණ පරීක්ෂණය
- Ultrasound Scan

වැඩිදුර පරීක්ෂණ අවශ්‍ය නම් පහත සඳහන් පරීක්ෂණ ද සිදු කරනු ඇත.

- Fine Needle Aspiration Biopsy ඉතා කුඩා එන්නත් කටුවක් මගින් පටක ස්වල්පයක් ලබාගැනීම
- Cure Biopsy වඩා විශාල සාම්පලයක් ලබා ගැනීම
- Open Biopsy - නිර්වින්දනය කර සැක සහිත ප්‍රදේශය ශෛල්‍යකර්මයක් මගින් ඉවත් කිරීම
- හෝමෝන වල සංවේදීතාවය පරීක්ෂාව (Hormone Receptor Testing)

## පියයුරු පිළිකා සඳහා ඇති ප්‍රතිකාර මොනවාද?

- Surgery - ශෛල්‍යකර්මයක් මගින් කපා ඉවත් කිරීම
- Chemotherapy - ඖෂධමය පිළිකා නාශක
- හෝමෝන ආශ්‍රිත ප්‍රතිකාර වර්ග

ප්‍රතිකාර ක්‍රමය විවිධ සාධක මත තීරණය වේ.

- ආර්තවය සිදුවී ද යන්න
- පියයුරු පිළිකාවේ වර්ගය, වර්ගීකරණය (Staging ad Grading)
- සෛලවල ස්වභාවය
- ඔබගේ වයස

**වැඩිදුර විස්තර ලබාගත හැකි ක්‍රම**

- ඔබගේ පවුලේ වෛද්‍යවරයාගෙන්
- පියයුරු පිළිකා විශේෂඥ වෛද්‍යවරයාගෙන්
- Brest Cancer Nurse
- Breast Cancer Support Group
- Cancer Council Help Line 131120

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන
තිසර ගුවන්විදුලිය www.thisara.com

Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths